**තේ ශක්ති අරමුදල - 2018**

-------------------------------------

තේ ශක්ති අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යකයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016 ,2017 හා 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

----------------------

**(අ) ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

---------------------------------------------------

අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ලෙජර ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) **වත්කම් හා වගකීම්වල පැවැත්ම**

අරමුදල විසින් අවසන්වරට විගණනයට ඉදිරිපත් කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් , වගකීම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම |
|---|---|
| | රු. |
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 350,332,493 |
| ජංගම වත්කම් | 346,460,128 |
| මුළු වත්කම් | 696,792,621 |
| **වගකීම්** | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | (111,648,540) |
| ජංගම නොවන වගකීම් | 481,088,651 |
| ජංගම වගකීම් | 327,352,510 |
| මුළු වගකීම් | 696,792,621 |

| | රු. |
|---|---|
| විකුණුම් | 573,519,262 |
| විකුණුම් පිරිවැය | (552,517,570) |
| දළ ලාභය | 21,001,692 |

(ඇ) **සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තේ ශක්ති අරමුදල අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර අරමුදලේ ස්කන්ධ ප්‍රාග්ධනය ක්‍රමානුකූලව අඩු වෙමින් පැවැතුණි. ඒ අනුව 2011 වර්ෂයේ දී රු.මිලියන 553.04ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ දී රු.මිලියන 111.65 ක ඍණ ස්කන්ධ ප්‍රාග්ධන තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. මෙම තත්ත්වයන් මත 2016 ජුලි | ප්‍රතිව්‍යුහගතකරණය යටතේ කම්හල්වල බද්දු හා කළමනාකරණ ආදායමෙන් මේ වන විට රු. මිලියන 51ක් පමණ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇති අතර එමගින් සුභසාධන රක්ෂණ අරමුදල ගොඩනැගීම හා කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ගෙවීම සඳහා ක්‍රමානුකූලව අරමුදල් ගොඩනගමින් පවතී. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොටස් හිමියන්වෙත ප්‍රතිලාභ ලබා දීමට හා සුභසාධන රක්ෂණ අරමුදල නැවත ගොඩනැගීම සඳහා පියවර ගත යුතු බව. |

13 දිනැති අංක 16/1427/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තේ ශක්ති අරමුදලේ කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එම ප්‍රතිව්‍යුහගත කිරීම මගින් කර්මාන්තශාලා බදුදීමෙන් ලැබෙන ආදායමෙන් කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීමට හා රක්ෂණ ප්‍රතිලාභ ගෙවීමට ගොඩනැගී තිබූ රක්ෂණ අරමුදලෙන් කම්හල් අංශයට ලබා දී තිබූ රු. මිලියන 135 ක් පියවීමටත් සහ ඉන් අනතුරුව ඉතිරිවන බදු ආදායම මුදල් අමාත්‍යාංශය වෙත බැර කිරීම අපේක්ෂාව විය. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 40 ක් ස්ථාවර තැන්පත්හි ආයෝජනය කර තිබුණද උක්ත අරමුණු කරා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බුලත්කොහුපිටිය හා පොතුපිටිය තේ කර්මාන්තශාලා ඉදිකිරීම 2003 වර්ෂයේ නවතා දමා තිබුණ ද එම කර්මාන්තශාලා ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ එකතුව රු.18,042,351 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තේ කර්මාන්තශාලා 02ක් ඉදිකිරීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් මුදල ගෙවා ඇත. මෙම කර්මාන්තශාලා නිම කිරීම සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම මත අදාළ ඉදිකිරීම් නවතා දමා ඇති අතර අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් කොටසක් පමණක් ඉදි කර ඇත. එම ඉදිකිරීම් තක්සේරු කර පොත්වලට ඇතුලත් නොකිරීම මත මෙම තත්ත්වය නිරූපනය වේ. ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | ඉදිකිරීම් පිරිවැය තක්සේරු කර අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව . |

(ඉ) නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 2016 මාර්තු 31දිනැති හා අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 වගන්තිය | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කලයුතු වුවත්, 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂිකව ස්ථාවර වත්කම් සමීක්ෂණය කර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | අරමුදල සතු කර්මාන්තශාලාවල ස්ථාවර වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු. 4,565,247 ක් වූ පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා නිලධාරින් වෙත උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත පරිදි ලේඛන පවත්වාගත යුතු බව. |

3. මෙහෙයුම් සමාලෝචනය.

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) අරමුදලට අයත් මහවැලි තේ කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වය රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම වෙත 2017 අප්‍රේල් 28 දින පවරා තිබු අතර අරමුදලට එක් මාසික වාරිකයක් පමණක් අයකර ගැනීමට හැකිව තිබුණි. මහවැලි තේ කර්මාන්තශාලාවට තේ දළු සපයාගැනීමේ දුෂ්කරතාවය හා ආදායමින් වියදම් පියවා ගැනීමට නොහැකි වීමත් යන හේතුන් මත 2018 ජුනි 12 දින කර්මාන්තශාලාව නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගෙන තිබුණි.<br>ඒ වන විට මහවැලි කර්මාන්තශාලාව වෙනුවෙන් අරමුදලට අයවිය යුතු හිඟ | කම්හලේ කළමනාකාරිත්වය ලබා ගත් රයිගම් ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම විසින් කම්හල කළමනාකරණය ලබා ගත් දින සිට කම්හල නැවත තේ ශක්ති අරමුදල වෙත භාර දෙන තෙක් කම්හලේ තේ නිෂ්පාදනයන් සිදු කර නොතිබුණි. එම සමාගමේ ඇප තැන්පතු මුදලින් කම්හලේ සිදු කර තිබූ නවීකරණ කටයුතු වෙනුවෙන් දරා ඇති පිරිවැය තක්සේරු කොට අදාළ මුදල පියවීමට කටයුතු කරමින් පවතින අතර, ඉන් අනතුරුව තවත් හිඟ මුදලක් පවතින්නේ නම් එම මුදල අයකර ගැනීමට ඇති නීතිමය හැකියාව පරීක්ෂා කරමින් පවතී. | බදු ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| හිටි වාරික හා ප්‍රමාද ගාස්තු රු.13,691,243 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) මෙල්මෑන් ලංකා පුද්ගලික සමාගම වෙත බදු පදනම මත ලබා දී තිබූ වලහන්දූව කර්මාන්තශාලාව, 2018 ජූනි 1 දින නැවත අරමුදලට භාර දී තිබුණි.<br>මෙම ආයතනයෙන් අයවිය යුතු බදු මුදල් රු.6,345,000 ක් ද ඒ සඳහා ප්‍රමාද ගාස්තු රු.7,642,200 ක් ලෙස එකතුව රු.13,987,200 ක් බදුකරුගෙන් අයවිය යුතුව පැවතුණි. එහි ආරක්ෂිත තැන්පතුව ඒ සඳහා හිලව් කලද තවදුරටත් පවතින හිඟ මුදල රු. 9,757,200 ක් අයකර ගැනීමට කළමනාකරණය කටයුතුකර නොතිබුණි. | කම්හලේ කළමනාකාරිත්වය ලබා ගත් මෙල්මෑන් ලංකා පුද්ගලික සමාගම විසින් කම්හල කළමනාකරණය ලබා ගත් දින සිට කම්හල නැවත තේ ශක්ති අරමුදල වෙත භාර දෙන තෙක් කම්හලේ තේ නිෂ්පාදනයන් සිදු කර නොතිබුණි. එම සමාගමේ ඇප තැන්පතු මුදලින් හා කම්හලේ සිදු කර තිබූ නවීකරණ කටයුතු වෙනුවෙන් දරා ඇති පිරිවැය තක්සේරු කොට අදාළ මුදල පියවීමට කටයුතු කරමින් පවතින අතර ඉන් අනතුරුව, තවත් හිඟ මුදලක් පවතින්නේ නම් එම මුදල අයකර ගැනීමට ඇති නීතිමය හැකියාව පරීක්ෂා කරමින් පවතී. | බදු ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු මුදල් අය කරගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |
| (iii) 2017 හා 2018 වර්ෂයන්හීදී බදුපදනම මත ලබාදෙන ලද කර්මාන්තශාලා බදු දීම සම්බන්ධයෙන් එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව බදු මුදල් නොගෙවූ පොහොර ගබඩාව හා කම්හල් 7 කින් 2018 දෙසැම්බර් 31 දිනට අයවියයුතු රු.21,759,975 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මාස 13 ක් දක්වා හිඟ මුදල් නොගෙවූ බදු දේපල සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ වාරික නිසි පරිදි නොගෙවීම නිසා වලහන්දූව හා මහවැලි කර්මාන්තශාලා නැවත පවරාගෙන එම කළමනාකරණ ගැනුම්කරුවන්ගේ තැන්පතු මුදල රඳවාගෙන ඇත.<br>ගිලීමලේ හා කොත්මලේ තේ කර්මාන්තශාලාවල බදු හා කළමනාකරණ ගාස්තු නොගෙවීම මත එම ගැනුම්කරුවන් වෙත නීතිමය කටයුතු කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.<br>ඇල්පිටිය, දැරණියගල, දෙනියාය, මාවරල වත්ත හා මාවරල තේ කම්හල්හි බදු හා කළමනාකරණ ගැනුම්කරුවන් කැඳවා අයවිය යුතු වාරික මුදල් ගෙවන ලෙස දැනුවත් කර, ඇතැම් ගැනුම්කරුවන් ඔවුන්ගේ තේ තැරැව්කාර ආයතන හරහා අදාල බදු වාරික ගෙවීමට එකඟ කරවා ගෙන ඇත. | බදු ගිවිසුම් ප්‍රකාරව නීතිමය කටයුතු කඩිනමින් ඉටුකර හිඟ මුදල් අය කර ගත යුතු බව. |

| | | |
|---|---|---|
| (iv) කර්මාන්තශාලා බදු පදනම මත ලබාදීමේදී එළඹ තිබූ ගිවිසුම් අනුව ගෙවිය යුතු මාසික බදු කුලිය ඊළඟ මස පළමු වන දින හෝ ඊට පෙර නොගෙවීම මත ගතවන සෑම දිනකටම බදු මුදලින් සියයට 1 ක් දඩ අයකර ගැනීමට කටයුතු කල යුතුයි. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දිනට බදු මුදල් නොගෙවීම මත ප්‍රමාද ගාස්තු වශයෙන් රු.59,771,330 ක් අයකර ගැනීමට පවතින බව නිරීක්ෂණය විය. | කොන්දේසි වෙනස් කිරීම සම්බන්ධව යෝජනා ඉදිරිපත් වී ඇති බැවින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියන් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | බදු ගිවිසුම් අනුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු බව . |

**(ආ) නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කම්හල් ඒකාබද්ධව ගිණුම් සැකසීම සඳහා 2010 වර්ෂයේ වටිනාකම රු.2,435,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදී ගෙන තිබුණි. එසේ වුවද එම මෘදුකාංග මිලදී ගත් දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා එය අපේක්ෂිත ගිණුම් සැකසීමේ කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණි. | කර්මාන්තශාලාවල පිහිටීම අනුව ජාලගත කරගත නොහැකි වීම මත මෙම මෘදුකාංග පද්ධතිය භාවිතයට නොගෙන තිබූ අතර මේ වන විට ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ කර්මාන්තශාලා බාහිර පාර්ශවයන් වෙත බදු හා කළමනාකරණය යටතේ පවරා ඇති බැවින් එවැනි මෘදුකාංගයක භාවිත කිරීමේ හැකියාවක් නොමැත. | භාණ්ඩ හා සේවා ඇනවුම් කිරීමට පූර්වයෙන් ආයතනික අවශ්‍යතාවය හඳුනාගත යුතු අතර ගෙවීම් කිරීමට පූර්වයෙන් අපේක්ෂිත මට්ටමට පවතීද යන්න පරික්ෂා කළ යුතු බව. |

**(ඇ) වෙනත් සංවිධාන වලට මුදාහළ සම්පත්**

**පහත නිරීක්ෂණ කරුණු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සහකාර නිලධාරින් තුන්දෙනෙක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවටද, රියදුරකු කුඩා තේ වතු සංවර්ධන අධිකාරියටද, මුදාහැර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් ලෙස රු.1,459,614ක් අරමුදලෙන් ගෙවීම් කර තිබුණද එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට, කටයුතු කර නොතිබුණි. | තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ එහි සිටි ස්ථිර කාර්යය මණ්ඩලයෙන් කොටසක් අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පවතින පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම යන මැයෙන් 2017/04/18 දින ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2017/06/13 දින ලද තීරණය පරිදි සේවකයින් ආයතන සඳහා අනුයුක්ත කර ඇති අතර සේවා අවශ්‍යතාවය සලකා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත අදාළ නිලධාරීන් අනුයුක්ත කර ඇත. මෙම නිලධාරීන්ගේ වැටුප් ප්‍රතිපූර්ණය කරන පදනමින් අනුයුක්ත කර නොතිබිණි | බාහිර ආයතනයකට මුදාහළ ශ්‍රමය වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව . |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස්දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල විසින් කළමනාකරණ කම්හල්වල සේවකයින්ට සහ බාහිර පාර්ශ්වවලට එරෙහිව අධිකරණවල නඩු 62 ක් ගොනු කර තිබූ අතර අරමුදලට එරෙහිව අරමුදලේ සේවකයින් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් හා කම්කරු විනිශ්චය සභාවල නඩු 77 ක්ද 2018 දෙසැම්බර් 31 වනවිට විභාග වෙමින් පවතී. තවද අරමුදලේ සේවකයන් විසින් අරමුදලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවල පවරා තිබූ නඩු තීන්දු අනුව 2018 දෙසැම්බර් 31 වනවිට සේවකයන්ට ගෙවීමට සිදු වී තිබුණු වන්දි මුදල රු. 27,622,671 ක් විය. | තේ ශක්ති අරමුදලේ කම්හල්වල සේවය කළ කම්කරුවන් නව බදු / කළමනාකරණ ගැනුම්කරුවන් යටතේ තව දුරටත් සේවයේ තබා ගැනීමට අමප 16/P224/726/015-1 අංක දරණ 2016.07.05 දිනැති කැබිනට් අනුමැතිය ලැබී තිබුණි. එම කම්කරුවන් වෙත අඛණ්ඩව සේවය ලබා දීමේ කොන්දේසියක් බදු / කළමනාකරණය භාරදීමේ අවබෝධතා ගිවිසුම්වලට ඇතුලත් කර ඔවුන්ගේ සේවය තහවුරු කරන ලදී.<br>ඒ පිළිබඳව කම්කරු විනිශ්චය සභාවන් වෙත දැන්වුවත් කම්කරු විනිශ්චය සභාවන්හි පවරා තිබූ නඩු විභාග කරමින් වන්දි ගෙවීමට තීන්දු ලබා දෙන ලදී.<br>තවද කර්මාන්තශාලාවල දෛනික වැටුප් ලබන සේවකයන්ගේ සේවය අක්‍රමික ලෙස අවසන් කර ඇති බවට අදාල නඩු වලදී තීරණය වී ඇත.<br>ඒ අනුව නඩු නියෝග හේතුවෙන් පුද්ගලයන් 60ක් සඳහා රු. 24,602,381.25ක් ද, සමථ නඩු සඳහා පුද්ගලයන් 24ක් වෙනුවෙන් රු.3,020,290/-ක් ද, වශයෙන් රු. 27,622,671.25ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවා ඇත. | කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කිරීමේදී චක්‍රලේඛ හා අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුකූලව කටයුතු කළ යුතු බව. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව පනතේ නියමකර ඇති පරමාර්ථ ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් ඇතුලත් කර දිගුකාලීන දැක්මක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම කඩිනමින් කළ යුතු බව . |